# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

*India's National Spiritual Newspaper*

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAANS

**Editor : S. SAM SELVA RAJ**

**16 Languages**

**Vol. XIV** YEAR OF OUR LORD JESUS CHRIST, JANUARY 2020 **Issue No. 5**


## ශුද්ධවූ බයිබලය
## (යොහාන් 1:1-8)

1. ස්වාමිනි, ඔබ විශ්වාසකරමි. කිසිකලකත් ලජ්ජා නොවෙම්මා.
2. ඔබගේ ධර්මිෂ්ඨකමින් මා මුදා නිදහස් කළ මැනව. ඔබගේ කන මා දෙසට නමා මා ගැළෙවුව මැනව.
3. මා නිතරම යන පිණිස මට පර්වතය නිවාසයක් වුව මැනව, මා ගළවන්ට ඔබ අණ දී තිබේ. මක්නිසාද මාගේ පර්වතය හා බලකොටුවත් ඔබය.
4. මාගේ දෙවියන්වහන්ස, දුෂ්ඨයාගේ අතින් එනම් අධර්මිෂ්ඨ වූ කෲර වූ මනුෂ්‍යාගේ අතින්, මා මුදාගත මැනව.
5. මක්නිසාද ස්වාමි වූ දෙවියන්වහන්ස, මාගේ බලාපොරොත්තුව ඔබය.තරුණ වයස පටන් මාගේ විශ්වාසය ඔබය.
6. මවු ගැබෙහි පටන් ඔබ මා ඉසුලූසේක. මවු කුසින් මා පිටතට ගත්තේ ඔබය. මාගේ ප්‍රශංසාව නිතරම ඔබ ගැන වන්නේය.
7. මම බොහෝ දෙනෙකුට විෂ්මයක් මෙන් වෙමි, නුමුත් ඔබ මාගේ බලවත් රක්ෂාස්ථානයය.
8. මාගේ මුඛය දවස මුළුල්ලේ ඔබට ප්‍රශංසා කිරීමෙන් ද ගෞරව කිරීමෙන්ද පිරෙන්නේය.

## ඇදහිලිවන්තයන් වෙනුවෙන් ඔවුන් යාච්ඤා කරන විට

යාච්ඤාව යනු අපට ලැබිය හැකිවූ උතුම්වූ වරප්‍රසාදයකි. නමුත් එය අප වෙත ගලා එනුයේ උසස් වගකීමක්ද සමගිනි. අප සුව කිරීම සඳහා අවස්ථාවන් ඇති කල විටදී මෙම සේවයේ ක්‍රියාකාරීත්වය උපරිමයෙන් ගලා යනු ඇත. මෙම සේවයේ ක්‍රියාකාරීත්වය දැකීමට නම්, අප විසින් ඉදිරිපත් කල යුතු සාධක තුනක් තිබේ.

1. අපට දෙවියන්වහන්සේ කෙරෙහි පූර්ණ විශ්වාසයක් තිබිය යුතුය. මෙම දෙවියන්වහන්සේගේ සේවය ක්‍රියාත්මක වනවා දැකීමට කැමති අය අතර එක්සත්කමක් තිබිය යුතුය.

2. මෙම සේවය කිරීමට කැමති අය අතර සම්පූර්ණ ඒකත්වයක් තිබිය යුතුය. මෙම සේවය ක්‍රියාත්මකවීමට නම්, ඔවුන් එක්සිත්ව සේවය කරන විට එකිනෙකා සමඟ පූර්ණ එකඟතාවයක් හා ගෞරවයක් තිබිය යුතුය. යමෙක් තව කෙනෙකුට විරුද්ධව යාච්ඤා කරන්නේ නම්, එය එකමුතුභාවයට හා සුවයට බලපෑම් ඇති කරයි.

3. නමස්කාරය ජීවිත රටාවක් විය යුතුය. එය ඉරුදින නමස්කාරය පමණක් නොව, එය ඔබගේ ජීවිතයේ සෑම අංශයක් තුළම පැතිරී ගොස් තිබිය යුතු දෙයකි. අපගේ නමස්කාරය තුළ අප දෙවියන්වහන්සේව ගෞරවයට පත් කල යුතුය.

මෙම සාධක තුනම එනම්, සුව කිරීම, ඇදහිල්ල හා යාච්ඤාව ක්‍රියාතත්මක වන විට දෙවියන්වහන්සේගේ නායකත්වයට හා වැඩ කිරීමට විවෘත වූ ජීවන මාර්ගයක් ලැබෙනු ඇත. සුව කිරීමට අවශ්‍ය පුද්ගලයින්ගෙන් 75% ක්ම කුඩා කණ්ඩායම් රැස්වීම් තුලින් ගනු ලබති. මෙම රැස්වීම් වලදී සැබෑ දේව සේවයක් හා සැලකීමේ දේව සේවයක් කල හැකි බවත් ඒ නිසා ඔවුන් ගැඹුරුම අවශ්‍යතාවයන් සඳහා පවා උපකාර කල හැකි බවත් මා විශ්වාස කරමි. අනුකම්පාව හා දයාව යන දීමනා වලට වටිනාකමක් ගෙනදෙන්නේ මේ ස්ථානයේදීය. මෙම දීමනාවන් ඇති පුද්ගලයෙකු තුලින් හටගන්නාවූ සැනසීම, දිරිගැන්වීම සහ උපදේශනය එම පුද්ගලයාගේ අධ්‍යාත්මික සුභසාධනය සඳහා දැඩි සැලකිල්ලක් දක්වයි. ඔවුන් සඳහා ප්‍රායෝගික හා සානුකම්පිත ප්‍රේමයක් පෙන්වීමට හැකිවන පරිදි එකිනෙක අතර සම්බන්ධතාවයක් ඇතිකර ගැනීමට ඔව්හු උත්සාහ කරති. යම් පුද්ගලයෙකුට උපකාර කිරීමට අවශ්‍ය විටදී බොහෝ විට දෙවියන්වහන්සේ ඔවුන් ගැන පවසන්නාවූ දේ ගැන දැනගැනීමට උන්වහන්සේට සවන්දීම ප්‍රමාණවත් වේ. සානුකම්පිත අවබෝධයකින් ඔවුන් ඔබ ගැන සැලකිලිමත් වන අතර ඔවුන්ගේ සුභසාධනය හදවතින්ම පෙන්වනු ඇත.

*4 වෙනි පිටුවට ...*

*Touching lives by Teaching ....... Since 1969*

# කැඳවීමේ ප්‍රතිරාවය

"ඔබ ස්වකීය යහපත්කම නමැති ඔටුන්නෙන් අවුරුද්ද සරසනසේක"
(ගීතාවලිය 65:11)



**2020 නව වසර පුරාවටම ස්වාමින්වහන්සේ ඔබ සමග වේවා..**
**ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ප්‍රිය සහෝදර සහෝදරිය,**
**ස්වාමි යේසුස්වහන්සේගේ සාමය හා කරුණාව ඔබට ලැබේවා....**

ඔව්, ඓතිහාසික වශයෙන් වැදගත්කමක් ඇති නත්තල සහ 2020 නව වසරේදී එකිනෙකුට සුභ පැතීම ඔබටත් මටත් සැබෑ ආශිර්වාදයකි. ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මේ නව වසර පුරාවටම උන්වහන්සේගේ කරුණාව අපගේ ජීවිතයට දී තිබේ. එබැවින් උන්වහන්සේව සෙවීමටත්, උන්වහන්සේ උදෙසා ජීවත්වීමත් හා උන්වහන්සේගේ කැමැත්ත අපගේ ජීවිතයෙන් ඉටු කරන පිණිසත් තීරණයක් ගත යුතුය. දෙවියන්වහන්සේගේ වචනයෙහි මෙසේ පවසා ඇත. ''***අපේ දෙවියන්වහන්සේගේ හස්තය උන්වහන්සේ සොයන සියල්ලන් කෙරෙහි යහපත පිණිස වන්නේය......***'' ***(එස්රා 8:22)*** එම නිසා අපගේ ජීවිතයේ සෑම දිනකම උන්වහන්සේගේ කැමැත්ත කුමක්ද කියා ගැනීමට අප ඉතා ප්‍රවේසම් විය යුතු අතර අපට නිසි මගපෙන්වීම ලබා ගැනීම පිණිස උන්වහන්සේ තුලම රඳා පැවතිය යුතුය. ''***නුඹේ සියලු මාර්ගවලදී උන්වහන්සේ සලකාපන්න, එවිට උන්වහන්සේ නුඹේ මාවත් සමතලාකරනවා ඇත.***'' ***(හිතෝපදේශ 3:6)***

මා සිතන පරිදි, සෑම උදෑසනකම මා මගේ ස්වාමීන් වූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අභිමුඛත්වය වෙතට ගොස්, උන්වහන්සේ ඉදිරියේ දණ ගසා, ස්තුතිවන්ත හදවතකින් මගේ සියලු හැකියාවන් හා දුර්වලතාවයන් ගැන පාපොච්චාරණයක් කර මෙම යාච්ඤාව එතුමාට ඔප්පු කරමි, ''මාගේ ස්වාමීනි, දෙවිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව, මා එක් දෙයක් දනිමි. එනම්, ඔබ සොයන්නන් ඔබගේ හදවත හඳුනාගෙන ඔබගේ කැමැත්ත කරයි. ***(යෙරෙමියා 32:19)*** ඔබගේ හදවත දැනගෙන ඔබගේ කැමැත්ත කිරීමට ඔහුට හැකිය. ***(යෙසායා 6:8)*** සියයට සියයක්ම, ඔව්, ස්වාමිනී, මම මෙහි සිටිමි, අද මාගෙන් ප්‍රයෝජන ගන්න, ඔබ කැමතිදේ කිරීමට මා කැමැත්තෙමි. ඔබගේ කරුණාව මට දෙන්න, කරුණාකර, ඔබගේ ආඥාවන් වලින් ඉවත්වීමට මට ඉඩ නොදෙන්න. ***(ගීතාවලිය 119:9)*** මම මා තුලම දුර්වලව සිටිමි. එබැවින් අද ඔබගේ අමිලවූ රුධිරයෙන් මාව නැවත ඇඹුව මැනව.' අපගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ අපට පිලිතුරු දෙන්නාවූ දෙවියන්වහන්සේය, උන්වහහන්සේ මාගේ යාච්ඤාවට පිලිතුරු දෙමින් හා මා ගැන බලා ගනිමින්ද, මාගේ ශාරීරික දුර්වලතාවයන්, මනුෂ්‍යන්ගෙන් ලැබෙන ආධාර ප්‍රමාණවත් නොවීම්, මුදල්, සමාජයෙන් ලැබෙන්නාවූ සහයෝගයන්ද නොතකා මාගේ යාච්ඤාවන් වලට පිලිතුරු දෙමින් මගේ සියලු අවශ්‍යතාවයන් සපුරාලනු ඇත. උන්වහන්සේගේ පොරොන්දුව පරිදි මාගේ ජීවිතයේ සෑම දිනකම සෑම අංශයකම උන්වහන්සේගේ කරුණාව සෑහෙන්නේය. ''***මාගේ කරුණාව නුඹට සෑහේය.***'' (2 ***කොරින්ති 12:9)***





**CHIEF EDITORS**
Pastor S. Sam Selva Raj
Angeline Selvakumari Henry, M.A., M.Ed.

**MANAGING EDITOR**
Pastor Alex Samson Sam, B.Th., M.Div.

**ADMINISTRATION**
Bro. N. Prakasam, M.A., General Manager

**EDITORIAL BOARD**
Sis. Jesy Veena Sam
Bro. M. Paulraj, M.A., B.Ed.
Sis. Serena Bevin, M.A., M. Phil., B.Ed.

**ADVISORY BOARD**
Adv. Jose Abraham
Adv. N. Balaji, B.Com., B.L.
Dr. S. Rabinder Boaz, M.S.
Er. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM)
Aud. K. Puratchivendan, M.Com., B.L.
Bro. Rajeswaran Samuel, B.Com.



**PUBLISHER & PRINTER**
Pastor S. SAM SELVA RAJ
**Echo of His Call Printers**
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
**Phone :** (+91-44) 2852 8282
2852 9293, 2854 7766
**Email :** sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
**Websites :**
www.echoofhiscall.org
www.echoofhiscall.com



**Our Ministries:** ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ✱ BIBLECOR - Postal Courses (3 languages) ✱ Theological Correspondence Courses (2 languages) ✱ Church Planting ✱ Nehemiah Bible Colleges ✱ Gospel Printing Press ✱ Great Commission Partners ✱ Village English High School ✱ Crusades ✱ 24 Hour Prayer Ministry ✱ Community Development

*2 පිටුවෙන්....(කතෘ වැකිය ඉතිරි කොටස)*

මාගේ ප්‍රිය සහෝදරයා, සහෝදරිය, සර්වබලධාරී, දෙවියන්වහන්සේ වන ස්වාමීවූ යේසුස්ක්‍රිස්තුස්වහන්සේගේ මෙම ධෛර්‍යයමත් කිරීමේ වචනය අදටත් ඔබගේ උපකාරයක් වනු ඇත. ඔබගේ ජීවිතයේ ආශ්චර්‍යමත් දේ ඔබ දකිනු ඇත. (මීකා 7:15)

කරුණාකර මතකතබාගන්න, බොහෝ දුෂ්කරතාවයන් හා මහත් වෙහෙසක් දරා අප සෑම මසකම භාෂා 16 කින් මෙම කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව ප්‍රකාශයට පත්කර ඔබ වැනි ආදරණීයයන් වෙත යවමු. මෙය ඔබගේ එදිනෙදා ජීවිතයේ විශාල දියුණුවකට බලාපොරොත්තුවක් ඇති කරයි. ලොව පුරා විසිරී සිටින්නාවූ මගේ යාච්ඤා හවුල්කරුවන් සමඟ ඔබ වෙනුවෙන් යාච්ඤා කිරීමේ වගකීම මම පෞද්ගලිකව භාරගෙන ඇත්තෙමි. එබැවින් ඔබ සැමවිටම යාච්ඤාවේ ආවරණය යටතේ සිටින බව විශ්වාසයෙන් සිටින්න. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපට මෙය දී ඇත.

අපගේ මෙම සඟරාව ඔබ ඉතා ඕනෑකමින් කියවීම ගැන මම සතුටු වෙමි. මන්ද ඒ සඳහා මා උදාහරණයක් උපුටා දැක්වීමට කැමැත්තෙමි. 2019 වසරේ නොවැම්බර් මස 27 වන දින දෙමළ භාෂාවෙන් නිකුත්වූ කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවේ යාච්ඤා ඉල්ලීම් වල යම් වරදක් සිදු විය. එදිනට ඔබ වැනි පුද්ගලයින්ගෙන් මා හට බොහෝ දුරකථන ඇමතුම් ප්‍රමාණයක් ලබාදෙමින් අසනු ලැබුනේ මෙම යාච්ඤාවෙහි තේරුම කුමක්ද? කියාය. අපි ඔවුන්ව අගය කරමු. අප අතින් සිදුවූ අත්වැරදීම අප ඔබගෙන් සමාන අයදිමු.

අපගේ පාඨකයන්ගේ යාච්ඤා අවශ්‍යතා වෙනුවෙන් යාච්ඤා කිරීමේ වගකීම කරගත් අපගේ යාච්ඤා හවුල්කරුවන්ට කැදවීමේ ප්‍රතිරාවය සේවය වෙනුවෙන් මා ස්තුති කරමි. සෑම මසකම විශ්වාසවන්තව යාච්ඤා කරන සහ දීමනාවන් ලබා දෙන දශක ගණනාවක් පුරාම අප සමඟ පවත්නාවූ නොනවතින හවුල්කාරීත්වය සමඟ ඔවුන්ගේ දායකත්වය නිසාද අපි ඔබට ස්තුති කරමු.

කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවේ 51 දින වසර නිසා අපි දෙවියන්වහන්සේට ස්තුති කරමු. මේ වසරේදී මගේ හැකියාවෙන් හා ශක්තියෙන් බැහැරව ඉන්දියාවේ සහ ඉන් පිටත සංචාරය කිරීම, සුභාරංචිය දේශනා කිරීම, නායකයන් පුහුණු කිරීම, සභාවන් රෝපණය කිරීම සහ ඉන්දියාව, නේපාලය, පකිස්ථානය, බංගලාදේශය හා ශ්‍රී ලංකාවේ සිටින පීඩිත ජනතාවට සමාජ සත්කාර සේවය හරහා දේව සේවය ව්‍යාප්ත කිරීම සඳහා සැලසුම් කරමු. මා දෙවියන්වහන්සේ හා ඔබ ඉදිරියෙහි ඉතා යටහත් වන අතර අප තුලින් ජාතීන් උදෙසා දෙවියන්වහන්සේගේ දැක්ම ඉටු කිරීම සඳහා පහත සඳහන් අවශ්‍යතා උදෙසා යාච්ඤා කරන මෙන් ඉල්ලා සිටිමු.

1. දෙවියන්වහන්සේගේ කරුණාව අපට ප්‍රේම කරන, අපව විශ්වාස කරන, අප වෙනුවෙන් යාච්ඤා කරන සහ මූල්‍යමය වශයෙන් අපට උපකාර කරන සියලු දෙනා සමඟම පවතින සේක.

2. අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇති, ඇදහිල්ල තුලින් අප සෑම දෙයක්ම කරන බැවින් අපගේ දෛනික අවශ්‍යතා සපුරා ගැනීම පිණිස දෙවියන්වහන්සේ අපට අවශ්‍ය මූල්‍යමය ආධාර සපයන පිණිස

3. ප්‍රධාන කාර්‍යයාලය, ශාඛා කාර්‍යයාල, දේවස්ථාන, ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් උසස් පාසල, නෙහෙමියා බයිබල් විදුහල, තැපැල් මාර්ගික බයිබල් පාඨමාලාව, දේව ධාර්මික පාඨමාලාව, මුද්‍රණාලය සහකාර සංස්කාරකවරුන් සහ ඔවුන්ගේ කාර්‍ය මණ්ඩලයේ සාමාජිකයන්, ධර්මදූත මධ්‍යස්ථාන යනාදියයි.

4. පරිගණක හා වාහන නඩත්තු කිරීම, මුද්‍රණාලය, උසස් පාසල, බයිබල් විද්‍යාලය, කාර්‍යයාලය පරිපාලනය, මාධ්‍ය අමාත්‍යංශය, මිෂනාරී කටයුතු අධීක්ෂණය හා නඩත්තු යන ක්ෂේත්‍රවල නව අභිෂේකලත් විධායකයින් කණිෂ්ඨ විධායකයින් ආත්මික නායකයින්, හා පුහුණු ශ්‍රමිකයන් මට අවශ්‍ය වී ඇත.

5. මගේ බිරිඳ වන ජෙඩී වීනා සෑම් පෙනහළු වල ආබාධයකින් පෙලුන අවස්ථාවේදී කනස්සල්ලට පත්වූ අවස්ථාවක් විය. 2018 වන වසරේදී වෛද්‍යවරුන්ට තිබූ බලාපොරොත්තුව අහිමි වුවද, දෙවියන්වහන්සේ තවමත් ඇයව මගේ සහයිකාව ලෙස තබාගෙන තිබේ.

6. මගේ පුතා පී. ඇලෙක්ස්ට දේව සේවය සඳහා විශේෂ කැඳවීමක්ද, තලෙන්ත සහ දේව සේවය සඳහා ජීවලිතයක්ද ඇත. ඔහුගේ දේවධර්ම අධ්‍යනයෙන් පසු ඔහු මා සමඟ ස්වාමීන්වහන්සේගේ සේවයෙහි යෙදෙන අතර මගේ බොහෝ වගකීම්ද ඔහු භාරගෙන ඇත. ඔහුට හොඳ යහපත් සුවයක් සහ ස්වාමීන්වහන්සේගේ සේවයෙහි යෙදීමට මහත් ශක්තියක් සහ බලයක් ලබා දෙන්නය කියා යාච්ඤා කරන්න.

7. මගේ දියණිය වන ඇන්ජලින් සෙල්වකුමාරි හෙන්රි දැන් ඉන්දියා දේශයෙන් පිටත සිටී. ඇය ස්වාමීන්වහන්සේ වෙනුවෙන් විශාල සේවයක් කල හැකි ඉතා දක්ෂ තැනැත්තියෙකි. දේව සේවයේ වගකීම් භාර ගන්නා පිණිස ඇයව නැවත ඉන්දියාවට ගෙන එන්නය කියා දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න.

2020 වන මේ නව වසරේ මගේ පැරණි මිතුරන් හා ආධාරකරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ව මිහිරි මතකයන්ද සමඟ මා සිහිපත් කරමි. මා නැවත වාරයක් ලෝකය පුරාම විසිරී සිටින්නාවූ පාඨකයින්, මිතුරු මිතුරියන් සහ උපකාර කරන්නන් ආදී සියල්ලන්ටම අපගේ ස්වාමීවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නොනවතින හා ශුද්ධ නාමයෙන් ආශිර්වාද කරමි.

සුභ නත්තලක් හා 2020 අසිරිමත් නව වසරක් වේවා, කියා ප්‍රාර්ථනා කරමි.

**ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබගේ සේවක,**
**එස්. සෑම් සෙල්ව රාජ්**

*1 වෙනි පිටුවෙන්....*

ලූක් 11:1-13 හි 'තවද ඔවුන් එක්තරා ස්ථානයක යාච්ඤා කිරීමට නතරවූ විටදී යේසුස්වහන්සේගේ ගෝලයින්ගෙන් කෙනෙකු කථා කරමින්, 'ස්වාමීනි, යොහාන් ඔහුගේ ගෝලයින්ට යාච්ඤා කිරීමට ඉගැන්වූවක් මෙන් අපටද උගන්වන්නය' කියා පැවසුවේය. උන්වහන්සේ ඔවුන්ට පවසමින්, ඔබ යාච්ඤා කරමින් මෙසේ පවසන්න.''ස්වර්ගයේ වැඩසිටින අපගේ පියාණනි, ඔබගේ නාමයට ගෞරවය වේවා. ඔබගේ රාජ්‍යය පැමිණේවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද ඉටුවේවා. අපගේ දිනපතා භෝජනය අද අපට දුන මැනව. අපට වැරද කරන අයගේ වැරදි කමා කරන්නාක් මෙන් අපගේ වැරදිද කමා කල මැනව. පාප අවස්ථාවන්ට අසුවීමට අපට ඉඩනොදී අයහපතින් අප මුදා ගත මැනව.'' කියා පැවසීය. ඔබ අතරින් කවරෙකුට මිත්‍රයින් සිටිද? මධ්‍ය රාත්‍රියේදී ඔහු තම මිතුරා වෙතට ගොස් මෙසේ පැවසීය. ''මාගේ මිත්‍රයෙකු ගමනක් ගොස් යන ගමන් මගේ නිවසට ආවා. ඔහුට දීමට මා ළඟ කිසි දෙයක් නැහැ.'' කියා එවිට නිවසෙහි සිටි මිත්‍රයා කථා කරමින් ''දැන් මට කරදර කරන්න එපා. දැන් දොරත් වසා ඇත. මාගේ දරුවොත් මා සමඟ ඇඳේ නිදාගෙන සිටින නිසා මට නැගිට සිට ඔබට යමක් දීමට නොහැකිය.'' කියා ඔහු පිළිතුරු දුන්නේය. ඔහු ඔහුගේ මිතුරා නිසාත් ඔහුට නොදෙන නුමුත් ඔහුගේ දැඩි කන්නලව්ව නිසා ඔහු නැගිට ඔහුට අවශ්‍ය දේ ලබා දෙනු ඇත. මා ඔබට මෙසේ පවසමි, ''ඉල්ලන්න, එවිට ඔබට දෙනු ලැබේ, සොයන්න, එවිට නුඹට සම්භවේ. තට්ටුකරන්න, එවිට දොර හරුනු ලැබේ..

''ඉල්ලන්නාට දෙනු ලැබේ, සොයන්නාට සම්භවේ, තට්ටුකරන්නාට දොර හරිනු ලැබේ.'' ''පුත්‍රයෙකු තම පියාගෙන් පාන් ඉල්ලුවොත් ඔහුට ගලක් දෙයිද? නැතහොත් ඔහු මාළුවෙක් ඉල්ලුවොත් ඔහුට මාළුවා වෙනුවට සර්පයෙකු දෙයිද? බිත්තරයක් ඉල්ලුවොත් ඔහුට ගෝනුස්සෙකු දෙයිද? මෙසේ නපුරු වූ නුඹලා නුඹලාගේ දරුවන්ට ඉතා හොඳම ත්‍යාගය ලබා දෙන්නේ නම්, ඔබගේ ස්වර්ගීය පියාණන්වහන්සේ උන්වහන්සේගෙන් ඉල්ලන්නන්ට ශුද්ධාත්මයාණ න් නොදෙන සේක්ද?

ගෝලයින් ඇසූ ප්‍රශ්නයට යේසුස්වහන්සේ අපට පෙන්වා දෙන්නේ යාච්ඤාවේදී අප ධෛර්‍යමත්ව හා නොපසුබටව ස්ථිරව සිටීම කෙතරම් වැදගත්ද කියාය. යේසුස්වහන්සේ උපමාවෙන් අපට පෙන්වා දුන්නේ දෙවියන්වහන්සේ යාච්ඤාවට පිළිතුරු දීමට දන්නා බවයි. එම බයිබල් කාල වකවානුව තුලදී පුද්ගලයෙකු වෙතට එන්නාවූ ආගන්තුකයෙකු ප්‍රතික්ෂේපකිරීමට කිසිවෙකුට නොහැකි බවයි. මන්ද එය ඔවුන්ගේ සංස්කෘතියෙහි කොටසකි. මේ වන විටත් එම මිත්‍රයා රාත්‍රියේදී නිවස ඇඳේ උණුසුම්ව නිදාගෙන සිටි නමුත් තම ගමේ ගෞරවය මේ තුලින් නැතිවී යන බැවින් තම අසල්වැසියාට උපකාර කිරීමේ වගකීම ඔහුට පැවරී තිබුණි. මිත්‍රයාගේ නිවසට නැවත නැවත තට්ටු කිරීමට සිදු වුවද තමාට ඔහු උදව් කරන බව දැන සිටියේය. යේසුස්වහන්සේ අපටද, පවසන්නේ අපද අපගේ යාච්ඤාව නොකඩවාම කලයුතු බවයි. මන්ද අපගේ ගිවිසුම සහ දෙවියන්වහන්සේගේ පොරොන්දු නිසා දෙවියන්වහන්සේ අපට පිළිතුරු දෙන බවත් අපට හානියක් නොවන සෑම යහපත් හා සම්පූර්ණවූ සෑම යහපත් දේම උන්වහන්සේ අපට දෙන බවත් දනිමු.

**ඇඳහිල්ලේ යාච්ඤාව :-**

***''සැබෑවක් නුඹලාට කියමි, කවරෙක් නුමුත් මේ කන්දට කථාකොට: ඉදිරී මුහුදේ වැටෙන්නැයි කියා, තමාගේ සිතින් සැක නොකොට, තමා කියනදේ සිදුවේයයි අදහන්නේ නම්, ඒක ඔහුට සිදුවන්නේය. එබැවින් නුඹලාට කියමි - නුඹලා යාච්ඤා කොට ඉල්ලන මොන දෙයක් වුවත් ඒ සියල්ල නුඹලාට ලැබුනේයයි අදහාපල්ලා. ඒවා නුඹලාට ලැබෙන්නේය. නුඹලා යාච්ඤා කරමින් සිටින කල ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේ විරුද්ධව යමක් නුඹලාට ඇත්නම් නුඹලාත් කමාවෙයල්ලා.''***

මෙම හාස්කම සිදුවන්නේ රෝගාතුරු වීමට හේතුන් නොසලකා පුද්ගලයාගේ සුවය ඉල්ලා යාච්ඤා කරන විටදී පමණය. යාච්ඤා කිරීම සහ නිරාහාරව සිටීම හොඳය. අප ඉතා අධිෂ්ඨානයෙන් සහ උනන්දුවෙන් යාච්ඤා කරනවාය කියන දෙයින් අදහස් වෙන්නේ එය දෙවියන්වහන්සේගේ කාලය හෝ උන්වහන්සේගේ කැමැත්ත එය නොවන බවයි. මන්ද ඔහුගේ කාලය දන්නේ දෙවියන්වහන්සේම පමණි. අප යාච්ඤා කරමින් දේව වචනය නිසිලෙස කියවනවා නම්, අපට දෙවියන්වහන්සේගේ කැමැත්ත කුමක්ද කියා දැනගත හැකිය. මන්ද උන්වහන්සේගේ කාලය දන්නේ උන්වහන්සේම පමණි. අපට අපගේ යාච්ඤාව නතර කිරීමට නොහැකිය. මන්ද දෙවියන්වහන්සේගේ කැමැත්ත කුමක්ද කියා එළිදරව් කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේ අපට උපකාර කරයි. අපට දෙවියන්වහන්සේව අත්හැරිය නොහැකිය.

***ක්‍රියා 28:8 හි මෙසේ පවසයි. ''තවද පබ්ලියස්ගේ පියා උණෙන් සහ රක්තාතිසාරයෙන් පීඩිතව ඔත්පලව උන්නේය. පාවුල් ඔහු උන් තැනට ගොස් යාච්ඤාකොට, ඔහු පිට අතත් තබා ඔහු සුවකලේය.''***

මේ අවස්ථාවේදී පාවුලු සිටියේ මෝල්ටා දූපතේය. ඔහුලේ පියාවූ පබ්ලියස් අසනීපව සිටි අතර ඔහුට සුවය ලැබීමට අවශ්‍ය විය. ශුද්ධ ලියවිල්ලෙහි අපට පැහැදිලිවම පෙන්වා දෙන්නාවූ කාරණය නම්, අපෝස්තුලු පාවුල් තේරුම්ගත් දෙයක් නම්, මනුෂ්‍යයෙකු මිනිසාට අත් තැබීමට පෙර ප්‍රථමයෙන් දෙවියන්වහන්සේගේ සුවය ලබා ගැනීම යාච්ඤා කිරීමේ අවශ්‍යතාවය ගැනයි. බොහෝ විට රෝගීන්ව බැලීමට යාමේදී මෙය අප විසින් කරන්නාවූ වරදකි. අප දෙවියන්වහන්සේ ගැන අවබෝධය, ප්‍රශංසාව, දයානුකම්පාව හා උපදෙස් ගැන යාච්ඤා නොකරමු. දෙවියන්වහන්සේගේ සුව කිරීමේ බලය ක්‍රියාත්මක වෙන්නේ කෙසේදැයි කියා අපට උපදෙස් දීමට උන්වහන්සේට හැකිය. පාවුලු මෙන් එම සහතිකය මත අපට උපදෙස් දුන් දෙයට කීකරු වන පුද්ගලයා මත අත තැබිය හැකිය.

***1 යොහාන් 5:14-15 ''උන්වහන්සේ ඉදිරියෙහි අපට තිබෙන නිසැකකම නම්, අප උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක් ඉල්ලුවොත් උන්වහන්සේ අපේ ඉල්ලීම අසන බවය. අප යම් දෙයක් ඉල්ලන කල උන්වහන්සේ අසන බව අප දනිමු නම්, අප උන්වහන්සේගෙන් ඉල්ලු දේ අපට ලැබෙන බව දනිමු.''***

*6 වෙනි පිටුවෙන්....*

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ජන : 19-** මෙම වසරේදී දෙවියන්වහන්සේට වඩාත් ලංවී සේවය කිරීමට ඔබට ලැබුන දර්ශනය ගැන ස්තුති කරන්න.

**ජන : 20-** කිතුණු ළමා සේවාවන් පිළිබඳවත්, මේ වසරේ දරුවන් ශුද්ධාත්ම බෞතීස්මය ලබා ගැනීම පිළිබඳවත් ස්තුති කරන්න.

**ජන : 21-** දෙවිඳුන්ගේ අනුග්‍රහය සහ අභිමුඛය මේ වසර පුරාම සියලුම ජාතීන් කෙරෙහි ලැබීම පිළිබඳව ස්තුති කරන්න.

**ජන : 22-** ''කැඳවීමේ ප්‍රතිරාවය'' පුවත්පත් සේවයේ සියලුම සේවා අංශ ගැන ස්තුති කරන්න.

**ජන : 23-** අධික පාපයට හා ශාපයට හසුවී ජීවත් වන අය ඉන් මිදීම පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ගැලවීම ලැබීම ගැන ස්තුති කරන්න.

**ජන : 24-** මෙම වසරේ අධ්‍යන කටයුතු ආරම්භ කල සියලුම බයිබල් විද්‍යාල සිසු සිසුවියන් ගැන ස්තුති කරන්න.

**ජන : 25-** ශ්‍රී ලාංකිකයන් තුලට බලවත් ශුද්ධාත්ම වැගිරීමක් ඉල්ලමින් දෙවිඳුන්ට යාච්ඤා කරන්න.

**ජන : 26-** දේශයේ තරුණ තරුණියන් විශාල පිරිසක් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ගැලවීම ලබාගැනීමට පිළිබඳව ස්තුති කරන්න.

**ජන : 27-** ජනාධිපතිතුමා, අගමැති තුමා ඇතුලු දේශපාලන නායක නායිකාවන් ගැන ස්තුති කරන්න.

**ජන : 28-** රෝහල් සේවය තුලින් දෙවිඳුන්ගෙන් ලැබුන දිව්‍යමය සුවය ගැන ස්තුති කරන්න.

**ජන : 29-** සෑම ඇදහිලිවන්තකයෙකුම තුල දෙවිඳුන් කරමින් සිටින මහත් පිළිබඳ ගැන ස්තුති කරන්න.

**ජන : 30-** කිතුනු දේවධර්ම ඉගැන්වීම් වල මහත් ඵලදායිතතාව ගැන ස්තුති කරන්න.

**ජන : 31-** කිතුනුවන් ඉශ්‍රායෙල් දේශය පිළිබඳ උනන්දුවෙන් යාච්ඤා මැදිහත්කම් කිරීම ගැන ස්තුති කරන්න.

### 2020 පෙබරවාරි මාසය

**පෙබ : 01-** ජනවාරි මාසය පුරාවටම අපව ආරක්ෂා කල, පෝෂණය කල, සමාදානය දුන් කරුනාවන්ත ශුද්ධ ත්‍රිත්වීය දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**පෙබ : 02-** දේහ සීමා පවතින රටවල අසල ජීවත් වන ජනතාව ආරක්ෂා කරන දෙවිඳුන්ට ස්තුති කරන්න.

**පෙබ : 03-** පාලක සෑම් සෙල්ව රාජ් ඇතුලු පවුලේ සියලු දෙනා නපුරු බලවේග වලින් ආරක්ෂා කල දෙවිඳුන්ට ස්තුති කරන්න.

**පෙබ : 04-** කිතුනු දේව සභාවල මූල්‍යමය අවශ්‍යතා ගැන ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**පෙබ : 05-** මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූ අයට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුලින්ම නව ජීවනයක් ලැබෙන පිණිස ගැන යාච්ඤා කරන්න.

**පෙබ : 06-** විථිවල ජීවත් වන ජනතාවට සුදුසු නිවසක් ලැබෙන ලෙස යාච්ඤා කරන්න.

**පෙබ : 07-** ශ්‍රී ලංකාවේ සෑම ගම්මානයකම ගෘහ සභා බිහිවෙමින් දෙවිඳුන්ට නමස්කාර කිරීමට හැකිවන ලෙස යාච්ඤා කරන්න.

**පෙබ : 08-** මිශනාරීවරුන් හා ශුභාරංචි සේවකයන්ගේ ආරක්ෂාව ගැන යාච්ඤා කරන්න.

**පෙබ : 09-** අල්ලස් ගැනීම ඇතුලු සියලුම මූල්‍යමට දූෂනවල යෙදෙන අය නිදහස්වී ගැලවීම ලබාගන්නා පිණිස යාච්ඤා කරන්න.

**පෙබ : 10-** ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමට යන ධීවරයන්ගේ ආරක්ෂාව ගැන යාච්ඤා කරන්න.

**පෙබ : 11-** සෑම කිතුනු දේවස්ථානයක්ම අවට ජීවත්වන සියලු දෙනාගේම ගැලවීම පිණිස යාච්ඤා කරන්න.

**පෙබ : 12-** මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූ අය ඉන් නිදහස්වන පිණිස යාච්ඤා කරන්න.

**පෙබ : 13-** සාක් කලාපය රටවල් පිලිබඳව යාච්ඤා කරන්න.

**පෙබ : 14-** ඉශ්‍රායලය උදෙසා යාච්ඤා කරන්න.

**පෙබ :15-** රැකියා විරහිත සෑම අයෙකුටම සුදුසු රැකියාවක් ලැබෙන ලෙස යාච්ඤා කරන්න.

**පෙබ : 16-** විවාහ අපේක්ෂිත සෑම අයෙකුටම සුදුසු විවාහයක් සිදුකරගැනීමට හැකිවන ලෙස යාච්ඤා කරන්න.

**පෙබ : 17-** පිලිකා රෝගින්ගේ දිව්‍යමය සුවය උදෙසා යාච්ඤා කරන්න.

**පෙබ : 18-** ''කැඳවීමේ ප්‍රතිරාවය'' පුවත් පත් සේවය තව ඉදිරියට වර්ධනය වීමටත් එහි නිර්මාතෘ පාලක සෑම් සෙල්වරාජ් උදෙසාත් යාච්ඤා කරන්න.

4 *වෙනි පිටුවෙන්....*

දෙවියන්වහන්සේගේ කැමැත්ත සිදුවූ විට උන්වහන්සේගේ බලය අප කෙරෙහි මුදා හරිනු ලැබේ. යේසුස්වහන්සේ අපගේ ආදර්ශයයි. දෙවියන්වහන්සේ දෙවියන්වහන්සේම වන අතර උන්වහන්සේට අවශ්‍ය ඕනෑම දෙයක් කිරීමට උන්වහන්සේට නිසැකවම අයිතියක් ඇත. නමුත් උන්වහන්සේ කුමන දෙයක් කරනු ලැබුවත් පියාණන්වහන්සේගේ කැමැත්ත කුමක් කියා දැන ගැනීමට උන්වහන්සේට නිතරම අවශ්‍ය බව අප දේව වචනය තුල කියවමු. පියාණන්වහන්සේගේ කැමැත්ත කුමක්ද කියා සොයාගත් විට යාච්ඥා කල යුතු ආකාරය අප දැනගන්නෙමු. අපගේ යාච්ඥාවන් වලට පිලිතුරු ලැබෙන්නේ එලෙසිනි. අප දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගෙන එයට යටත්වී සූදානම්ව සිටින විට අප යාච්ඥා කරනු ලබන්නේ උන්වහන්සේගේ කැමැත්තට අනුව මිස අපගේ ආශාවන්ට අනුව නොවේය.

***රෝම 8:26-27 ''එලෙසම ආත්මයාණන්වහන්සේත් අපගේ දුර්වලකම්වලදී උපකාරකරනසේක. මක්නිසාද යුතුලෙස යාච්ඥා කරන්ට අපි නොදනිමුව, නුමුත් ආත්මයාණන්වහන්සේම කිය නොහැකි කෙඳිරිගෑම් වලින් අප උදෙසා මැදිහත්කම් කරන සේක. ඒ ආත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ශුද්ධවන්තයන් උදෙසා මැදිහත්කම් කරන බැවින් සිත් විමසන තැනැන්වහන්සේ උන්වහන්සේගේ අදහස කුමක්දැයි දන්නා සේක.''***

දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව යාච්ඥා කලයුත්තේ කෙසේද කියා අපි නොදනිමුව. දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව අපගේ යාච්ඥාව ආලේපයෙන් පුරවමින් අපට උපකාර කරන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේය. අපගේ යාච්ඥාවට උපකාර කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේට අප ආරාධනා කරන විට දෙවියන්වහන්සේ සහ අප අතර සන්නිවේදන මාර්ග දෙකක් විවෘත වෙනු ඇත. ශුද්ධාත්මයාණන්වහන්සේ අපට දෙනු ලැබුයේ මේ සඳහාය.

***යොහාන් 14:26 ''නුමුත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේ එවන සැනසිලිකාරයාණන්වහන්සේ, එනම් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලාට සියල්ල උගන්වමින්, මා විසින් නුඹලාට කියන ලද සියල්ල නුඹලාට සිහිකරවන සේක.***

***යොහාන් 16:13-15 ''එසේවී නුමුත්, උන්වහන්සේ, එනම් සැබෑකමේ ආත්මයාණන්වහන්සේ ආ කල, උන්වහන්සේ මුළු සත්‍යකරා නුඹලාට මගපෙන්වනසේක. මක්නිසාද උන්වහන්සේ තමන්ගෙන්ම උපදවා කථා නොකර, උන්වහන්සේ අසන දේ කියා, ප්‍රකාශකරනසේක. උන්වහන්සේ මා ගෞරවයට පමුණුවනසේක. මක්නිසාද උන්වහන්සේ මා සන්තක දෙයින් රැගෙන නුඹලාට ප්‍රකාශකරනසේක. පියාණන්වහන්සේ සන්තක සියල්ල මාගේය. එහෙයින්, උන්වහන්සේ මා සන්තක දෙයින් රැ ගෙන නුඹලාට ප්‍රකාශකරන සේක.***

අප යාච්ඥා කිරීමට පෙර දෙවියන්වහන්සේගේ කැමැත්ත කුමක්ද කියා අපට එළිදරව් කරන පිණිස අප ශුද්ධාත්මයාණන්වහන්සේට ආරාධනා කලයුතුය. උන්වහන්සේ එය කෙලින්ම අපගේ ආත්මයට ඇතුල් කරයි. ***(ක්‍රියා 11:12)*** අපට දර්ශනයක් ලබාදෙයි. ***(ක්‍රියා 10:9-18)*** හෝ උන්වහන්සේ අපට ඇසෙන පරිදි කථා කිරීමෙන් ***(ක්‍රියා 9:4-5)*** හෝ අපට සිහිනයක් ලබාදීමෙන් ***(මතෙව් 1:20-21)*** හෝ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මැදිහත්කාරකම (රෝම 8:26) හෝ ධර්ම වාක්‍ය පැවසීම තුලින් ***(1 කොරින්ති 14:3)*** හෝ අපව උන්වහන්සේ තුල තබා ගැනීම පිණිස සියල්ල වෙනස් ආකාරයකින් ස්ථිර කර තැබීම. ***(ක්‍රියා 15:28)*** හෝ අපව දේව වචනය වෙත යොමු කිරීමෙන් ***(2 තිමෝති 3:15-16)***, අප දෙවියන්වහන්සේගේ ආත්මයාණන් සමඟ වැඩකරන තාක්කල් එය සිදුකරන්නේ කෙසේද යන්න ගැටළුවක් නොවේ. අප ශුද්ධාත්මයාණන්වහන්සේ සමඟ සහයෝගීව කටයුතු කරන විටදී අපගේ යාච්ඥා වලට උන්වහන්සේ තුලින් විශාල බලයක් හා ආධිපත්‍යයක් හිමිවෙයි.

දෙවියන්වහන්සේ පුද්ගලයෙකු ජීවිතය තුල තම යහපත්වූ කැමැත්ත කරන්නේ නම් එම පුද්ගලයාගේ ජීවිතය තුල වඩා ශුද්ධකම හා විශ්වාසවන්තකම ඇති කරයි. ඔහු එය කරන්නේ රෝගී තත්වයකින් හෝ පීඩාවකින් නම් ඔවුන්ගේ ශාරීරික සුවය මුලුමනින්ම ලැබෙන්නය කියා අපි යාච්ඥා කල යුතුය. සුව කිරීමේ දීමනාව තවමත් ඇත්තේ දෙවියන්වහන්සේගේ හස්නයෙහිය. ඉතා අත්‍යාවශ්‍යයි. අප විශ්වාස කරන්නාවූ ඕනෑම අවශ්‍යතාවයක් සඳහා යාච්ඥා කරන ලෙස අපට බයිබලය උපදෙස් දී ඇත. දෙවියන්වහන්සේට යාච්ඥාවට පිලිතුරු දිය හැකි අතර එම අවස්ථාවේදී හෝ වෙන ඕනෑම විටකදී පුද්ගලයෙකුට සුවය නොලැබෙන්නේ නම් අයට ඒ ගැන තර්ක කල නොහැකිය. මන්ද දෙවියන්වහන්සේගේ කැමැත්තට හෝ අරමුණට අනුව ඔහුට සුවය ගෙනදීමට උන්වහන්සේට හැකිය.

එසේනම් අත්‍යාවශ්‍ය අවශ්‍යතාවයක් යනු කුමක්ද? දෙවියන්වහන්සේ අපගේ ස්වර්ගීය පියාණන් බවත් උන්වහන්සේ අපගේ යහපත හා යහපැවැත්ම උදෙසා කිසිවක් අපගෙන් නොවලක්වන බවත් අප විශ්වාස කල යුතුය. මගේ දරුවන් ඔවුන්ගේ අවශ්‍යතාවයන් හා ආශාවන් රැගෙන මා වෙතට පැමිණෙන විටදී, ඔවුන්ගේ එම ඉල්ලීම් හා අවශ්‍යතාවයන් වල එතරම් හදිසිතාවයක් හෝ වැදගත්කමක් මා බොහෝ විට නොදකිමි. එය මා නරක පියෙකු බවට පත් නොකරයි, නමුත් මා ඔවුන්ට වඩා වැඩි යමක් දන්නා අතර ඔවුන්ට හොඳ දේ කුමක්ද හා දිගුකාලීනව ඔවුන්ට අයහපතක් වෙන්නාවූ දේ කුමක්ද කියා මා හොඳින් දනිමි. ඔවුන්ගේ ඉල්ලීම් ලබාදීමට මා තීරණයක් ගනු ලැබුවේ ඔවුනව සතුටට පත් කරන්නාවූ දේ මත පමණක් නොව ඔවුන්ව ගොඩනැගීමටත්, වර්ධනය කිරීමටත්, ඔවුන්ව වැරදි මාර්ගයෙන් ඉවත්කර තැබීමටත් හැකිවෙන්නාවූ දේ මතය. අප බොහෝ විට මෙලෙස පවසමු. එනම්, ''එය ඔබට රිදෙනවාට වඩා මාව රිදවයි'' යනුවෙනි. මක්නිසාද සමහර අවස්ථාවෙන් වලදී අපගේ දරුවන් අඬාවි සහ සමහර අවස්ථාවන් වලදී ඔවුන්ට හානියක් කරගනී, නමුත් අප ඔවුන්ට වැඩීමට ඉඩදිය යුතුය.

***ගීතාවලිය 84:11 ''මක්නිසාද දෙවිවූ ස්වාමීන්වහන්සේ සූර්යයෙක්ය, පලිහක්ය. ස්වාමීන්වහන්සේ අනුග්‍රහයත් මහිමයත් දෙන සේක. අවංකලෙස හැසිරෙන්නන්ගෙන් කිසි යහපතක් නොවලක්වන සේක.''***

දෙවියන්වහන්සේගෙන් අපට ලැබෙන්නාවූ සුවයේ දීමනාව අපට යහපතක් නම්, දෙවියන්වහන්සේ එය තම ආදරණීය දරුවන්ගෙන් වලක්වන්නේ නැත. අප යාච්ඤා කරනවිටදී දෙවියන්වහන්සේ අපට ප්‍රේමකරන බවත්, අප ගැන සැලකිලිමත් වන බවත්, අප වෙනුවෙන් යහපත් වූ දේ කිරීමට කැමති බවත් උන්වහන්සේ අපගෙන් කිසිම යහපත් දෙයක් වලක්වන්නේ නැති බවත් අප දැනගත යුතුය. දෙවියන්වහන්සේ සුවකරන්නා වන අතර උන්වහන්සේ කිසි විටෙකවත් සුව කිරීමේ සේවය අතහැරියේ නැත.

***පිලිප්පි 4:6-7 ''නුඹලා කිසිවක් ගැන කනගාටු නොසිතා, සියල්ලෙහිදී ස්තුති දීම සමඟ යාච්ඤා වෙන්ද කන්නලව්වෙන්ද නුඹලාගේ ඉල්ලීම් දෙවියන්වහන්සේට දන්වන්න. එවිට කිසි නුවණකින් දැනගත නොහැකි වූ දෙවියන්වහන්සේගේ සමාදානය ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුල නුඹලාගේ සිත්ද සිතුවිලිද ආරක්ෂාකරනවා ඇත.''***

***මතෙව් 21:22 ''තවද නුඹලා ඇදහිල්ල ඇතුව යාච්ඤාවෙන් ඉල්ලන කොයි දෙයක් නමුත්, ඒ සියල්ල නුඹලාට ලැබේයයි'' කී සේක.*** අප යාච්ඤාවෙන් ඉල්ලන්නාවූ දේ දැනටමත් ලැබී ඇත කියා අපි විශ්වාස කරමු. අප ඇදහිල්ලෙන් ඉල්ලන්නාවූ ඕනෑම දෙයක් එය අප දැකීමටත් පෙරම ලැබුනේයයි කියා ප්‍රකාශ කල යුතුය. සුවවීම සිදුවී ඇති බවට සාක්ෂි සහ ප්‍රතිඵල තුලින් නොපෙනුනත් අපට දැනටමත් සුවයදී තිබේය කියන ස්ථාවරත්වය තුල දැඩි විශ්වාසයකින් සිටිය යුතුය. අපගේ යාච්ඤාව හා විශ්වාසය ඇති වූ මොහොතේ සිට අපට සුවය නිදහස් වනු ඇත. සමහර අවස්ථාවන් වලදී සුවය ලැබීමට ටික කලක් ගතවෙන නමුත් දෙවියන්වහන්සේ සුවය නොදෙන බව එයින් අදහස් නොකරයි. යාච්ඤාවෙන් පසුව අපගේ රෝගයට සුවය නොලැබෙන විටදී අපගේ මනසට හා හදවතට සැකයක් ගෙන ඒමට යක්ෂයා මෙය අවස්ථාවක් කරගන්නේය. ඔබ දෙවියන්වහන්සේව සෙවීමටත් උන්වහන්සේව විශ්වාස කිරීමටත් වග බලා ගන්න. මන්ද ***හෙබ්‍රෙව් 11:6 හි අපට මෙසේ පවසයි. ''නුමුත් ඇදහිල්ල නැතුව උන්වහන්සේව ප්‍රසන්න කිරීමට නුපුළුවන. මක්නිසාද දෙවියන්වහන්සේ වෙතට ළඟාවෙන්නා විසින් උන්වහන්සේව විද්‍යාමාන බවත් උන්වහන්සේ සොයන්නන්ට විපාකදෙන කෙනෙකු බවත් විශ්වාස කරන්ට ඕනෑය.''***

බොහෝ දෙනක් ස්වාමීන්වහන්සේ ගෙනත් සුවය ලබා ගැනීමට අපොහොසත් වී ඇත්තේ ඇදහිල්ලේ යාච්ඤාවෙන් පසු ක්ෂණික ප්‍රතිඵල නොලැබෙන නිසාත් ඔවුන්ව සුවකල යුතු ආකාරය සහ උන්වහන්සේ ඔවුන්ට ආශිර්වාද කලයුතු ආකාරය ගැන දෙවියන්වහන්සේට උපදෙස් දීමට යන නිසාත්ය. මෙම යාච්ඤාවට පිලිතුරු ලැබීමේ යතුර නම්, දෙවියන්වහන්සේ අපගේ යාච්ඤාව අසා ඇති බවත් එම යාච්ඤාවට පිලිතුරු දීමට උන්වහන්සේව අප හා සමග ගිවිසුමකින් බැඳී සිටින බවත් විශ්වාස කිරීමයි. දෙවියන්වහන්සේ යාච්ඤාවට යම් ක්‍රමයකට හෝ ක්ෂණිකව පිලිතුරු දෙනු ඇත. නමුත් උන්වහන්සේ පිලිතුරු දෙනු ඇත.

***''ඒ දවසේදී නුඹලා මාගෙන් කිසිවක් අසන්නේ නැත. සැබෑවක් සැබෑවක් නුඹලාට කියමි. පියාණන්වහන්සේගෙන් නුඹලා යමක් ඉල්ලුවොත් උන්වහන්සේ මාගේ නාමයෙන් ඒ දේ නුඹලාට දෙනසේක. මේ දක්වා මාගේ නාමයෙන් නුඹලා කිසිවක් ඉල්ලුවේ නැත. නුඹලාගේ ප්‍රීතිය සම්පූර්ණවන පිණිස ඉල්ලාපල්ලා. එවිට නුඹලාට ලැබෙන්නේය.***

යේසුස්වහන්සේ අපගැන කථා කරමින් සිටින අතර උන්වහන්සේ අද කථා කරමින් සිටී. අප දෙවියන්වහන්සේගේ දරුවන් නිසා දැන් අපට යේසුස්වහන්සේගේ නාමය කරණකොටගෙන කෙලින්ම පියාණන්වහන්සේට යාච්ඤා කල හැකිය. යේසුස්වහන්සේ කල්වාරියට යාමට පෙර මෙම වචන වලින් කථා කල සේක. එවන තෙක් යාච්ඤා කරනු ලැබුයේ යේසුස්වහන්සේට නොව, ආබ්‍රහම්ගේද ඊසාක්ගේද යාකෝබ්ගේද දෙවියන්වහන්සේටයි. යේසුස්වහන්සේගේ නාමයෙන් පියාණන්වහන්සේට යාච්ඤා කිරීමට අවශ්‍ය සෑම දෙයක්ම

*8 වෙනි පිටුවට...*


**ඔබගේ කරුණාවන්ත අවධානය සඳහා**

**කැඳවීමේ ප්‍රතිරාවය** තුළින් සිදුවන විවිධාකාර සේවයන්, දෙවියන්වහන්සේගේ සේවයන් යයි ඔබ විශ්වාස කරනවාද?........................

කුමන ආකාරයකින් හෝ, **කැඳවීමේ ප්‍රතිරාවය** හි සේවයන්ට දායක වීමට ඔබ කැමති වන්නේද? .........................................................................

ඔබගේ මහත් සැලකිලිවන්ත යාච්ඥා තුළින් මෙම සේවයන් ඉදිරියේ **යාච්ඤා හවුල්කරුවකු** වීමට ඔබත් කැමතිද?............................

**,කැඳවීමේ ප්‍රතිරාවය,** සේවයන් හමුවේ, කුඩා මාසික දීමනාවකින් (මාස 12) ඇදහිල්ලේ පංගුකාරයකු වීමට, ඔබ අදහස් කරන්නේද?

..........................................................................................................................................................................................

කරුණාකර අපට ලියන්න.



**ECHO OF HIS CALL,**
10, Mohammed Abdullah II Street, Chepauk, Chennai - 600 005, India.
Ph.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766 Cell: (+91) 98410 71852.
**E-mail: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in Websites: www.echoofhiscall.org / www.echoofhiscall.com**

*7 වෙනි පිටුවෙන්....*

උන්වහන්සේ අප උදෙසා ඉටුකරනු ලැබීය. ශුද්ධ ලියවිල්ල තව දුරටත් අපට පවසන්නේ, ඔබ මේ දේවල් ඉල්ලා සිටීමට හේතුව අපගේ ප්‍රීතිය පිරී ඉතිරී යන පිණිසය. යේසුස්වහන්සේ අපව ප්‍රීතියෙන් තැබීමට උනන්දු වෙයි.

***යාකෝබ් 5:13-15 ''නුඹලා අතරෙහි යමෙක් දුක්විඳින්නේද? ඔහු යාච්ඤා කරාවා. යමෙක් ප්‍රීතියෙන් සිටින්නේ ද? ඔහු ගී කියාවා නුඹලා අතරෙහි යමෙක් රෝගාතුරුව සිටින්නේ ද? ඔහු සභාවේ වැඩිමහල්ලන්ට හඬගසාවා, ඔවුහු ස්වාමින්වහන්සේගේ නාමයෙන් ඔහුට තෙල් ආලේපකොට, ඔහු උදෙසා යාච්ඤා කරත්වා. එවිට ඇදහිල්ලේ යාච්ඤාවෙන් රෝගාතුරයාට සුවය ලැබේ. ස්වාමින්වහන්සේ ඔහු නැගුටුවනවා ඇත. ඔහු පාපයක් කර තිබේ. නම්, ඒවා ඔහුට තමා කරනු ලැබේ.''***

ශුද්ධ ලියවිල්ලේ මෙම පරිච්ජේදයෙහි වැඩිමහල්ලන්ගේ දේව සේවය පිළිබඳව සාකච්ඡා කර ඇත්තෙමු. මෙහිදී මෙම යාච්ඤාව ඇදහිල්ලේ යාච්ඤාවක් බව අවබෝධ කරගත යුතුයි. මෙම යාච්ඤා දිව්‍යමය ඇදහිල්ලෙන් ඇතිවෙන්නාවූ යාච්ඤාවකි. මෙම යාච්ඤාව දෙස බලන විටදී එය ඇදහිල්ලෙන් කරන යාච්ඤාවට වඩා වැඩි දෙයක් බව අප දැන සිටිය යුතුය. එය සුව කිරීම සඳහා දෙවියන්වහ්නසේ අපට ඇදහිල්ල ලබා දෙන්නාවූ විශේෂ යාච්ඤාවකි. එය දෙවියන්වහන්සේ විසින් දේවානුභාවයෙන් කරන්නාවූ දෙයකි. යාච්ඤා කිරීමට පෙළඹෙනු ඇත. එය දෙවියන්වහන්සේගේ කැමැත්ත නම් ඔවුන් ක්ෂණිකවම සුව වෙනු ඇත.

***මතෙව් 1:19-20 ''නැවතත් නුඹලාට කියමි, පොළොවේදී නුඹලාගෙන් දෙදෙනෙක් තමුන් ඉල්ලන යමක් ගැන එක්සිත්වන්නෝ නම්, ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේගෙන් ඒ දේ ඔවුන්ට ලැබෙන්නේය. මක්නිසාද දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් හෝ මාගේ නාමයෙන් යම් තැනක රැස්ව සිටිත් නම් එතැන ඔවුන් මැද සිටිමියි'' කීසේක.***

මෙයින් පවසන්නේ ඔබ කොතැනක සිටියත් පොළොවේදී දෙදෙනෙකු යම් දෙයකට එකඟවන්නේය යන අදහසයි. එය සභාවේ රැස්වෙන්නාවූ රැස්වීමක් ලෙස අදහස් නොවේ. අප යේසුස්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කලහොත් එම ඉල්ලීම ඉටු කිරීමට උන්වහන්සේ එහි සිටින බව යේසුස්වහන්සේ අපිට සහතික කරයි. යේසුස්වහන්සේ එහි වැඩවාසය කිරීම ඉතාම පුදුම සහගතය, නමුත් එම කාරණය ඉටු කිරීම පිණිස දෙදෙනෙකු පමණක් සිටීම ඊටත් වඩා හොඳ දෙයකි. එලෙස යම් පුද්ගලයෙකුගේ සුවය උදෙසා මුළු සභාවම එක්සත්වී යාච්ඤා කිරීම උසස් දෙයක් නමුත් ශුද්ධ ලියවිල්ලට අනුව එම සුවය ලැබීමට අවශ්‍ය වන්නේ දෙදෙනෙකු පමණි. මෙහි ප්‍රධාන යතුරු පදය නම් එකඟවීමයි. ඇදහිල්ල හා බලාපොරොත්තුව අතර වෙනසක් ඇතිබවද ඔබ තේරුම් ගැනීම ඉතාම වැදගත් වේ. ඔබ ඕනෑම දෙයක් සම්බන්ධයෙන් එකඟවන විට එයට ඇදහිල්ල අවශ්‍ය වේ. බලාපොරොත්තුව එය නොකරනු ඇත. යේසුස්වහන්සේ සිටින බවට ඔබට බලාපොරොත්තුව ඔබට තිබේ නම්, ඔබ ඉල්ලූ ලෙසම ඔබට සිදු නොවනු ඇත. දැන් තිබිය යුත්තේ ඇදහිල්ලයි

අප යාච්ඤා කරන්නාවූ පුද්ගලයෙකු තුල ඇදහිල්ල ඇති කිරීම පිණිස බලපෑමක් ඇති කිරීමට නොහැක. එය පුද්ගලයා විසින් කරන්නාවූ තේරීමක් විය යුතුය. අප නොඇදහිලිවතුන්ට සේවය කරන විටදී ''උන්වහන්සේගේ තුවාල වලින් අපි සුවය ලබමු'' යැයි කියා පැවසුවහොත් එයින් ඔවුන්ට කිසිවක් අදහස් නොකෙරේ. ඔවුන් ආත්මයෙන්ම එම වචන තේරුම්ගෙන එය දකින්නේ නම් පමණක් ඔබට එලෙස ප්‍රකාශකිරීමට හැකිය. එසේ නොමැතිනම්, ''ඔබ එය විශ්වාස කරන්නේ නම්, ඔබට එය ලැබෙනු ඇත.'' කියා ප්‍රකාශ කිරීම ප්‍රඥාවන්ත දෙයකි. ඔවුන් පවසන්නාවූ දේ විශ්වාස කිරීමට ඔවුන් සූදානම් නම්, ඇදහිල්ලේ යම් මට්ටමක් ක්‍රියාත්මක වන අතර ඒ තුලින් දෙවියන්වහන්සේට ගමන් කිරීමට මාර්ගයක් විවෘත වෙනු ඇත. වෛද්‍යවරයා වෙනත් ආකාරයකින් පවසන තුරු ඔවුන්ගේ ඖෂධ තුල රැඳී සිටීමට ඔවුන්ට ඉඩ දෙන්න.


# ECHO OF HIS CALL

**Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.**

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministry** is supported by the free-will offerings and donations of the God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us. Whenever you change your postal or e-mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our websites also. You can read it by going into the site as well as downloading it and get blessed.

Your letters, prayer requests and your financial helps (by D.D., Cheque, M.O. etc.) to **ECHO OF HIS CALL** may be sent to the address below.

Please send your **Land Phone / Cell Phone Numbers and E.mail addresses** for updation.



**ECHO OF HIS CALL**

10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai - 600 005, India.

Phone : (+91- 44) 2852 8282, 2852 9293, 2854 7766 Cell : (+91) 98410 71852

E-mails : sam@echoofhiscall.org / biblecor@yahoo.co.in Websites : www.echoofhiscall.org / www.echoofhiscall.com



# PIT TO PALACE
## පාලු වලකින් මාලිගාවට
## "...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

**කිතුණුවන්ට බාධා නොකරන්න. ඔහුට පහර නොදෙන්න. (සැහැල්ලුවට නොගන්න) ඔබ ඔහුව කපා දැමුවහොත් ඔහු වැඩියෙන් වර්ධනය වෙයි. ඔබ ඔහුව වැඩි වැඩියෙන් යටපත් කල විට ඔහු ඉහළටම වැඩෙනු ඇත.**

මගේ පියා ආරක්ෂක අංශයේ සේවයෙහි නියුතුව, සිටි නිසා මා හැදී වැඩුනේ මගේ සීයා සහ ආච්චිගේ පවුලේ සාමාජිකයෙක් ලෙසයි. ඔවුන් මා ඉතා හොඳ කිතුනුවෙකු ලෙස වර්ධනය කරන පිණිස ආත්මික සත්‍යතාවයන් මට උගන්වනු ලැබීය. එමෙන්ම දෙවියන්වහන්සේගේ ප්‍රේමය මා තුල ඇති කිරීම පිණිස ඔවුන් මාව දේවස්ථානයේ විවිධ සේවාවන් වලටද, ඉරුදින දහම්පාසලට හා වෙනත් අධ්‍යාත්මික රැස්වීම් වලටද රැගෙන ගියේය.

අපගේ පවුල තුල දෙවියන්වහන්සේගේ ප්‍රේමය තුලට පැමිණි ප්‍රථම පුද්ගලයා මගේ සීයාය. ඔහුගේ මුල් නම එම්. නාරායනන් (මිථ්‍යා දෘෂ්ඨික දෙවියන්ගේ නම) වන අතර ඔහු ක්‍රිස්තුස්වහන්සේ වෙතට පැමිණි විට ඔහුගේ නම් එන්. නතානියෙල් ලෙස වෙනස් කරන ලදි. ඔහු ඉඩම් විශාල ප්‍රමාණයක් සහ වෙනත් දේපල තිබූ ධනවත් මිනිසෙකි. මා ඉතා කුඩා අවධියේ සිටම ඔහු මාව පාසලට, විශේෂ පුහුණු පන්තිවලට, සභාවේ විවිධ සේවාවන් වලට සහ ඉරුදින ළමුන් සඳහා පවත්වන දහම්පාසලට රැගෙන ගොස් නැවත නිවසට රැගෙන ගෙන ආවේය. ඒ දිනවල නිසි ප්‍රවාහන පහසුකම් නොතිබුණ හෙයින් ඇවිදිමින් මා වෙහෙසට පත්වූ සෑම අවස්ථාවකදීම ඔහු මාව ඔහුගේ උරහිස මත තබා රැගෙන ගියේය. ඔහු මාර්ගයේ යන විටදී, ''මා කුඩා යේසුස්ව රැගෙන යනවා'' ය කියා මිනිසුන්ට පවසනු ලැබුවේය.

ඔහු මට බොහෝසේ ආදරය කල අතර කුඹුරුවල සියළු වැඩ හොඳින් කිරීම, අස්වැන්න නෙලීම, ගොනුන් හා ගොන් කරත්තත නඩත්තු කිරීම, කුඹුරු වැඩ වලට අවශ්‍ය දේ මිලදී ගැනීම, කෙතෙන් ලැබුණු අස්වැන්න විකිණීම, පිහිනීම ආදී කාර්‍යයන්වල හොඳ පුහුණුවක් මට ලබා දුන්නේය.

දිනක් මා ඔහුගේ උරහිස මත නැගී සිටියදී ඔහුට බොහෝ සේ මහන්සිය දැනුන හෙයින් ඔහු මාව බිම තබා ඔහු පර්වතයක් මත හිඳගත් අතර මාව ඔහුගේ උකුල මත හිඳුවාගෙන ''මගේ පුතේ, ඔයා ලොකු උනාම මට දෙන්නේ මොනවාද ?'' කියා මගෙන් ඇසුවේය.

මෙම ප්‍රශ්නයට මා දිය යුතු පිළිතුර කුමක් දැයි කියා මා නොදත් අතර මා ඔහුව ඉතා තදින් වැළඳගෙන ඔහුගේ මුහුණ දෙස ගැඹුරු ලෙස බැලුවෙමි. පසුව අප අපගේ ගමන නැවත ආරම්භ කලෙමු.

සීයා මගෙන් ඇසූ ප්‍රශ්නය මගේ හදවතට බලපෑමක් ඇති කලේය. ඔහුට යමක් දීමට මට නිතරම අවශ්‍ය විය ඒ දිනවලදී ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන ලැබෙන්නාවූ ගැලවීම පිළිබඳ නිසි අවබෝධයක් නොතිබුණි. මගේ සීයා නිතරම දේවස්ථානයට යන අයෙක් වුව ද ඔහු සභාවට විශාල සහයෝගයක් ලබා දුන් අයෙක් වුව ද ඔහුගේ මරණයෙන් පසු ඔහු යන්නේ කොතැනට ද කියා ඔහු දැන සිටියේ නැත.

මා තරුණයක් ලෙස වැඩී වර්ධනය වන විටදී යේසුස් වහන්සේ ගැන දැනගැන්මෙන් වර්ධනය වූ විට ස්වාමින්වහන්සේ මගේ සීයා සහ ආච්චි පිළිබඳව යම් බරක් මට ඇති කලේය. දිනක් මා ඔවුන් සමග වාඩිවී සිටින විටදී මා ඔවුන්ගෙන් මෙලෙස ඇසුවෙමි. ''අපිට ස්වර්ගයට යාමට සිදුවුහොත් අප කුමක් කල යුතුද? කියා. එවිට ඔහුගේ පිළිතුර වූයේ, ''අපගේ පාස්ටර් පමණක් යයි'' යනුයි. එය මගේ හදවතට තදින්ම දැනුනි. මෙම හේතුව නිසා අහිංසක කිතුණුවන් අතර ඇති නොදැනුවත්කම නැතිකර දැමීම සඳහා යමක් කරන පිණිස ශුද්ධාමයාණන්වහන්සේ මාව පොළඹවනු ලැබුවේය.

මා යෞවනයෙක් වූ විට, දෙවියන්වහන්සේගේ මග පෙන්වීම මත තමිල්නාඩු වේ කන්‍යාකුමාරි දිස්ත්‍රික්කයේ මුත්තම් නම් මුහුදු වෙරළේ ශාලාවක ''විශේෂ පසුබැස්මක්'' යන රැස්වීමක් සංවිධානය කළෙමි. එය මගේ නව සේ දේව සේවයට ගිය පළමු පසු බැසීමයි එවකට එය හැඳින්වූයේ ශුභාරාංචි යාච්ඤා කාණ්ඩායම ලෙසය. එම කාලය වන විටදී මගේ වයස අවුරුදු 18 ක් වූ අතර මම ප්‍රධාන දේශකයා විය. මම මගේ සියලු මිත්‍රයන්ට හා නෑදෑයින්ට එයට ආරාධනා කර දිවා ආහාරය පැකැට් රැගෙන මගේ ගොන් කරත්තය සමග මා එම ස්ථානයට ගියෙමි. මගේ සීය තාත්තා සහ ආච්චි අම්මා ද දිනක් මෙම පසු බැසීමේ රැස්වීමට සහභාගි වූහ. රැස්වීම ආරම්භ කරන ලද අතර මගේ සීයා සහ ආච්චි මා දෙස පුදුම සහගත ලෙස බලා සිටිමින් ''මගේ පුත්‍රය, අද ඔබ කරන්න යන්නේ කුමක් ද?'' කියා නොසන්සුන් තත්ත්වයට පත්ව සිටියහ.

මගේ ප්‍රාදේශීය සභාවේ ඉරුදින පාසලේ ගුරුවරු විසින් උගන්වනු ලැබූ ගීතිකා ගායනා කිරීම මහ මහත් විශ්වාසයක් විය. පණිවිඩය බෙදාගැනීමේ කාලය පැමිණි බූරුවෙකු ලිහා දැමීමේ සිදුවීම ගැන මා දේශනා කලෙමි.

RNI NO. TN/SIH/2006/17846

*9 වෙනි පිටුවෙන්...*

***(මතෙව් 21:1-10)*** පණිවිඩය අවසාන කරමින් මා දේවැගැති එස්. දේවදාසන් විසින් ලියු පරණ ගීතිකාවක් එනම්, ''අනේ මගේ පුතේ, මගේ දුවේ ඔබගේ සිත මට දෙනවාද ?'' කියන ගිතිකාව ගායනා කරන විට මගේ සියා සහ ආච්චි පෙර පාසල්වල හඬා වැටෙන කුඩා දරුවන් මෙන් දැඩි ලෙස වැළපෙමින් මා ඉදිරියෙහි සිටගෙන ස්වාමින් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරයෙන් ගැලවීම අවශ්‍ය බව ප්‍රකාශ කල අතර ඔවුන්ට පසුතැවිලි වන ලෙස ඉල්ලා සිටියෙමි. ඔවුන් පළමු වතාවට යේසුස් ක්‍රිස්තුස්වහන්සේව තම පුද්ගලික ගැලවුම්කරුවාණන් ලෙස පිළිගත්තෝය. අප සියල්ලෝම සදාකාලික බලාපොරොත්තුවක්ද ඇතිව පවසා කාලයේදී නැවත නිවෙස් බලා ගියෙමු. වසර කීපයකට පසු ඔවුන් නැවත නැගිටීමේ බලාපොරොත්තුව සමග සදාකාලික මහිමයට පැමිණුනේය.

ඔවුන් මාගේ ප්‍රථම ඵල විය. දැන් වසර 50කට වඩා වැඩි කාලයක් ගත වී ඇතත්, මෙම මතකයන් මගේ මනසේ නැවුම්ව පවතී. ස්වාමින්වහන්සේ මාව ඉන්දියාවේ සහ අසල්වැසි රටවලටද ලෝකයේ බොහෝ රටවලට ද ගෙන ගොස් ගැළවීම, ස්වර්ගීය සාමය සහ සදාකාල ජීවනය පිළිබඳ ශුභාරංචිය දේශනා කිරීමට මට හැකියාව ලබා දී ඇත.

ප්‍රිය සහෝදරයා සහෝදරිය, ඔබගේ පවුලේ සහ ඔබ ජීවත්වන ගම්මානයෙහි සිටින ඔබගේ ආදරණීයන්ට ගැලවීම හා සදාකාල ජීවනය ගැන ඔබ සිතුවා ද? මේ දිනවල නුතන දේශකයින් බොහෝ දෙනෙක් තම දෙමාපියන් සහ ඥාතීන් නොසලකා හරිමින් වචනයේ විවිධ කොටස් පමණක් ගෙන දක්වති. අප එලෙස වීමට අවශ්‍ය නොමැත.

ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය ගැන ඔබගේ සමීපතමයන් වන අයට සහ ඥාතීන්ට පැවසුවහොත් ඔබට විශාල ත්‍යාගයක් බලාපොරොත්තු විය හැක. නැවත ඉපදීම, ශුද්ධ ජීවිතය, දෙවියන්වහන්සේට සේවය කිරීම විනිශ්චය සහ සදාකල් ජීවනය පිළිබඳ අත්දැකීම් සත්‍යය... දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ඔබ සමග වේවා.

### කරුණාකර අප ප්‍රධාන සභාවේ සේවාවන් උදෙසා යාච්ඤා කරන්න.

1. යාච්ඤා සේවය - පැය 24 පුරා
2. බයිබල් තැපැල් පාඩම් මාලාව - ඉංග්‍රීසි, දෙමල හා හින්දි
3. කැඳවීමේ ප්‍රතිරාවය - මාසික සඟරාවන්
   දෙමල, ඉංග්‍රීසි, මලයාලම්, තෙලගු, හින්දි, මරාති, කන්නඩා, බෙංගාලි, ගුජරාති, ඔරියා, නේපාලි, අසාම්, පංජාබි, උර්දු, සිංහල සහ අප්‍රිකානාස්
4. නෙහෙමියා බයිබල් විදුහල
5. තැපැල් මාර්ගික බයිබල් පාඨමාලාව - දෙමල සහ ඉංග්‍රීසි
6. පුහුණුවීමේ වැඩසටහන්
7. චිත්‍රපටි සේවය සහ ශුභ ආරංචි රැස්වීම්
8. ශුභ ආරංචි පත්‍රිකා මුද්‍රණය කිරීම - ප්‍රකාශනය කිරීම.
9. මුද්‍රිත සේවය පවත්වාගෙන යාම.
10. ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසල
11. සබත් පාසල - ඉරිදා පෙ.ව 8.30
12. දෙමළ භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා පෙ.ව 5.00, 7.00 හා 10.00
13. තෙලෙගු භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා ප.ව 4.00
14. හින්දි භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා ප.ව 5.00
15. මලයාලම් භාෂාවෙන් දේව මෙහෙය- ඉරිදා ප.ව 5.00
16. ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා ප.ව 6.00
17. පත්‍රිකා බෙදා හැරීම. - ඉරිදා ප.ව 2.30
18. පාලක වරුන්ට උපදෙස් දීම. - ඉරිදා ප.ව 4.00
19. කාන්තා යාච්ඤාව - බදාදා ප.ව 5.30
20. සති මැද නමස්කාර දේව මෙහෙය
21. පුරුෂයින්ගේ යාච්ඤාව - සිකුරාදා ප.ව 8.00
22. සෙනසුරාදා දේව මෙහෙය - ප.ව 5.00
23. සේවකයින්ගේ රැස්වීම - සෙනසුරාදා ප.ව 6.00
24. ගෘහ රැස්වීම් - අඟහරුවාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා ප.ව 6.30
25. විශේෂ රාත්‍රි භෝජනය - පළමු ඉරිදා උදෑසන 5.30
26. දෙමාපියන්ගේ යාච්ඤාව - පළමු ඉරිදා ප.ව 4.00
27 උපවාස යාච්ඤාව - පළමු සෙනසුරාදා පෙ.ව 9.30
28. සර්ව රාත්‍රි යාච්ඤාව - දෙවෙනි සිකුරාදා ප.ව 9.30
29. ශුද්ධවූ රාත්‍රි භෝජනය - දෙවන ඉරුදින දේව මෙහෙය
30. දිනපතා උදෑසන දේව මෙහෙය - පෙ. ව 5.00
31. කාර්යාල මණ්ඩලයේ මෙනෙහි කිරීම - දිනපතා පෙ.ව 9.00
32. කාර්යාල සේවය - දිනපතා පෙ.ව 9.00 සිට ප.ව 9.00

**Regd. with the Registrar of Newspapers for India**
**under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
**on 2nd JANUARY 2020**
**If un-delivered please return to:**

**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

## *JESUS LOVES YOU!*

**To**

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from Old No.18, New No. 10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by him at **Echo of His Call Printers** Old No. 18, New No. 10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**